# ආදි ලක්දිව ජන සංක්‍රමණ හා ජන සම්මිශ්‍රන පිළිබඳ විමසුමක්

## (ප්‍රාග් ඓතිහාසික යුගයේ සිට මුල් ඓතිහාසික යුගය දක්වා)

ඩී. තුසිත මෙන්ඩිස්

ශ්‍රී ලංකාව වනාහි වර්ග කිලෝමීටර් 66000ක (වර්ග සැතපුම් 25332) ක විශාලත්වයෙන් යුත් ඉන්දීය උප අර්ධද්වීපයේ ඉන්දියාවට දකුණු දිගින් පිහිටි දිවයිනකි. (Cooray 1984:49) වර්තමානයේ සැතපුම් 22ක පටු සමුද්‍ර සන්ධියකින් වෙන් ව ඇති මේ දෙරට ප්ලයිස්ටෝසීන අවදියේ සිදු ස්වාභාවික ක්‍රියාකාරකම් නිසා ගොඩබිම් සබඳතා කිහිප වතාවක් ම ඇති වී නැති වී ගොස් තිබේ. එහෙත් වසර 1000 කට පෙර සිට ඒ සබඳතා මුළුමනින් ම ඇනහිට තිබේ. මෙසේ ඇති වූ ගොඩබිම් ලෙස ආදිතම අවධිවල දී ජීවීන්ගේ සංක්‍රමණ ශ්‍රී ලංකාව හා ඉන්දියාව අතර සිදු වූ බව දේශීය ප්ලයිස්ටෝසීන අවධියට සම්බන්ධ පාෂාණීභූත සත්ත්ව කොටස් මගින් පැහැදිලි වන බව පී.ඊ.පී දැරණියගල පෙන්වා දී ඇත.(Deraniyagala 1958:164)

ලක්දිව ආදිතම ජන සංක්‍රමණ හා සම්මිශ්‍රණ පිළිබඳ සාකච්ඡා කිරීමේ දී ඉන්දීය අර්ධද්වීපය හුදකලා කොට සාකච්ඡා කළ නොහැකි ය. විශේෂයෙන් ඉන්දීය භූමියෙහි අවසන් මිලියනය තුළ මානවයින් ජීවත් වුණු බවට සාධක තිබේ. ඒ කාලයෙහි ම මුහුදු මට්ටමේ උච්චාවචන අනුව නිරාවරණය වූ ගොඩබිම් තීරුව ඔස්සේ ශ්‍රී ලංකාව භූමියට මානවයන් පැමිණීමට ඇතැයි එස්. යූ. දැරණියගල උපකල්පනය කරයි. (Deraniyagala 2004. 03 ) . කෙසේ වෙතත් දැනට සිදු කර ඇති පුරාවිද්‍යා පර්යේෂණ අනුව ශ්‍රී ලංකාවේ මුල් මානව ජනාවාස පිළිබඳ ආදිතම සාධක අදින් වසර 125000 ක් තරම් ඈතට විහිදෙන අතර ( Deraniyagala 1992. 686 ) ඒවා අදින් වසර 300000 හෝ 500,000 කට පෙර හා ඉන් පෙර අවධි දක්වා ඈතට විහිදිය හැකි බව පෙනෙයි. (Deraniyagala 2004.04) ශ්‍රී ලංකාවේ පහළ පුරාශිලා යුගයට අයත් ඉතා රළු ගල් අවි (lower palaeolithic) වසර 250,000 ක කාලයට සැක කරති. මේ

ගල්-අවි බොහෝ විට මුලින් ම ආයුධ නිර්මාණය කළ හෝමෝ-හැබිලිස් මානවයාගේ බවට සැක කළ හැකි බව ද පෙනෙයි. ( අධිකාරි 2005. 20 ). ග්ලැසියර යූස්ටේසීය උච්චාවචන චක්‍ර හා සම්බන්ධ වර්තමාන අවධියට වසර 125,000 කට පූර්ව අවධියේ අවසාන අන්තර් භෞමික ප්‍රධාන මොනාස්ටෝරියානු සංසිද්ධියට පවරන ලද පතිරාජවෙල මූලික බොරලුවලට මග පෙන්වූ වැල්ලෙගංගොඩ බොරලු නූතන අවධියට වසර 75,000 කට පූර්ව මෑත මොනාස්ටෝරියානු සංසිද්ධියට හා සමාන සම්බන්ධතාවක් දක්වයි. (දැරණියගල 1990.223 ). ඉරණමඩු පස් සැකැස්මේ බොරලු ටෙරසයෙන් සොයාගත් මේ ගල් අවි මෙවලම් මධ්‍ය පුරාශිලා යුගයට අයත් අතර මේ කාලය තුළ ජීවත් වුණු මානවයා ඍජු සිරුරක් සහිත හෝමෝ ඉරෙක්ටස් බව අනුමාන කළ හැකි බව අධිකාරි පෙන්වා දෙයි. (අධිකාරි 2005.21) මේ අනුව ඉහළ පුරාශිලා යුගයේ සිට මධ්‍ය ශිලා යුගය වන විට ශ්‍රී ලංකාවේ මානව පරිණාම යුගය ක්‍රියාවලිය පැහැදිලි ලෙස සනිටුහන් වී තිබෙන අතර , මේ තත්ත්වය ඉන්දියානු අර්ධද්වීපයේ සිදු වූ සුවිශේෂී ක්‍රියාවලියක් ලෙස ඉන්දියානු ප්‍රාග් ඉතිහාසය පිළිබඳ ව කරුණු සෙවීමේදී පැහැදිලි වේ.

ශ්‍රී ලංකාවේ ආදි ජන සංස්කෘති පිළිබඳ මධ්‍ය ශිලා යුගය වැදගත් වෙයි. බලංගොඩ මානවයා අයත් වන මෙසොලිතික සංස්කෘතිය ශ්‍රී ලංකාව පුරාම ව්‍යාප්ත වී තිබුණු බවට සාධක තිබේ. (Deraniyagala 1992 687) අදින් වසර 34,000 කට පෙර පැවතුණි. එම සංස්කෘතිය හා එහි ජිවත් වූ මානවයා පිළිබඳ සාධක ෆාහියන් ලෙනෙන්, බටදොඹින්, බෙල්ලන් බැඳි පැලැස්සෙන්, බෙලිලෙනෙන්, අළු ලෙනෙන් හා අලිගලින් හෙළිදරව් වන අතර, මේ යුගයේ විසූ මානවයා වශයෙන් හැඳිනගෙන තිබේ.(Deraniyagala1992.690) බටදොඹ සහ කිතුල්ගල නූතන අවධියට වර්ෂ 29000ක් ෆ000ක් 12500ක් සහ පෙර විසූ පුද්ගලයින් 38 දෙනෙකුට අධික සංඛ්‍යාවකට අයත් යැයි සැළකිය හැකි විස්තීරණ මානව නෂ්ටාවශේෂ පෙළක් සොයා ගන්නා ලදී. (Deraniyagala 1990.25) බටදොඹ ලෙනෙහි නූතන අවධියට වර්ෂ 29000 පූර්ව යැයි ගැනෙන ස්ථරවලින් හමු වූ මානව අවශේෂ හතක් ආසියාවේ ආදිතම මානවයා පිළිබඳ සාක්ෂි ඉදිරිපත් වී ඇත. මේවා කවර තැනකින් වුව ද [illegible] ගත්

පුරාණ සමූහ තුනකට පමණක් සමාන වේ. ඒවා ප්‍රංශයේ ලෙස් කොටේස්, ඊජිප්තුවේ නස්ලෙටේස්බේට්ස් සහ චෙකෝස්ලෝවැකියාවේ දොල්නි වෙස්ටෝනි ඒවා නූතන අවධියට, පිළිවෙළින් වර්ෂ 3100ක් 30000ක් සහ 29000ක් පෙර සමයට අයත් ය. (Kennedy K.A.R, & S.U. Deraniyagala 1989.394-265). මෙහි තුලනාත්මක අධ්‍යයනය බටදොඹින් නියොජනය වූ මෙසොලිතික බලංගොඩ මානවයාගේ පටන් මෑත අවධිවල වැදි දඩයම් රැස් කරන්නා දක්වා අතරතුර සහසම්බන්ධතාවක් මානව වංශ විද්‍යාත්මක ව දැක ගත හැකි බව පෙනෙයි. ( Kennedy 1986. 165-265). ජනගහන ප්‍රවාහය ගැන සලකා බලන විට මෙයින් පැහැදිලි වන්නේ මේ අවදියේ දී ජනගහන ප්‍රවාහය අමිශ්‍රිත ව පැවති ඇති බවයි. විවිධාකාරයේ මිශ්‍රවීම්වලට ලක් වී විවිධ කායික ලක්ෂණවලින් සමන්විත නව ජනගහනයක් පසු කාලයේදී ශ්‍රී ලංකාවට සංක්‍රමණය වන තුරු බලංගොඩ මානව පරපුර දිගු කාලයක් අමිශ්‍රිත ව ඒකාකාරීත්වයෙන් පැවත ආ බව පෙනී යයි. දැනට නිගමනය කර ඇති ආකාරයට බලංගොඩ මානව පරපුරේ මිනිසෙකුගේ සාමාන්‍ය උස දළ වශයෙන් සෙ.මී. 174 ක් ද ගැහැණියකගේ උස දළ වශයෙන් සෙ.මී. 166 ක් වේ. ( Daraniyagala 1992.30-34 ) මෙම කරුණු මෙසේ වුවත් මෙහි දී සැලකිල්ලට ගත යුතු කරුණක් වන්නේ පුරාතන ශිලා අවධියේ සිට ශ්‍රී ලංකාවත් ඉන්දියාවේ දකුණු කෙළවරත් අතර අනිවාර්ය විග්‍රණයක් සිදු වූ බවට සැක සිතීමට ඉඩ තිබෙන බවයි. අනාගතයේ කරනු ලබන ජාන විද්‍යා පර්යේෂණවලින් මේ කලාපයේ ප්‍රාග්-ඓතිහාසික මානව ජාන සම්බන්ධතා ඇති වුණු බවට කරුණු හෙළිදරව් වනු ඇත.

වර්ගයෙන් සමන්විත සජාතීත්ව ජෛව පරපුරක් ලෙස දැනට පිළිගෙන තිබෙන මතය බිඳ වැටීමට ඉඩ ඇත (Deraniyagala 1992;17-20). මේ තත්ත්වය මෙස් වීමට ඉඩ ඇත්තේ මොවුන්ගේ ජීවන රටා ශ්‍රී ලංකාවේ වැදි ජනයා, ඉන්දියාවේ කදාර් ලෙපන්තරම් හා චෙන්චුස් ආදී වාසීන්, අන්දමන් දූපත්වල වාසීන් හා මැලේසියාවේ සෙමැන් වැනි ආදී වාසීන්ගේ ජීවන ක්‍රමය අතර දැඩි වෙනස් කමක් නොපවතින බැවිනි (Deraniyagala 1992:412-21,451-457)
මධ්‍ය ශිලා යුගයෙන් ඉක්බිති එළැඹිය යුතු නව ශිලා යුගය පිළිබඳ

සාධක ශ්‍රී ලංකාව ඇසුරින් පැවති බව තීරණාත්මක ව තවම ඔප්පු කොට නොමැත. විශේෂයෙන් ඉන්දීය අර්ධද්වීපයේ නියෝලිතික යුගයට විශේෂිත වූ ඔප දැමූ ගල් පොරෝ හා මැටි බඳුන් පිළිබඳ සාධක මෙන් හීලෑ කරන ලද වන සතුන් පිළිබඳ සාධක (Narasimhaich;sairaman 2004:203-05) ශ්‍රී ලංකාවෙන් හමු වී නොමැත. එහෙත් ආචාර්ය විජයපාලගේ දොරවක කන්ද කැණීම්වලින් වළං භාවිත කළ බවට සාධක හා ඒ සන්ධර්භවලින් ම ධාන්‍ය ශේෂ ද ලැබී තිබේ (විජයපාල 1992). එසේම ආචාර්ය ප්‍රේමතිලක ගේ හෝර්ටන් තැන්න පර්යේෂණ මගින් වසර 13000 කට පෙර කෘෂිකර්මාන්තය සම්බන්ධ තොරතුරු (Prematilake:2003) මගින් නව ශිලා යුගය පිළිබඳ ව ආලෝකයක් ලැබුණ ද ඉදිරියේ දී සිදු කරන පර්යේෂණ ඔස්සේ මේ තත්ත්වය මත ගත හැකි තීරණ වඩා තහවුරු කළ යුතුව පවතී.

ලක්දිව මධ්‍ය ශිලා යුගයෙන් අනතුරු ව එළඹි යුගය වශයෙන් පිළිගනු ලබන්නේ මුල ඓතිහාසික යකඩ යුගය වේ ( Deraniyagala 1992; 12 ). ශිලා යුගයේ සංස්කෘතිය අතරට ක්‍රි. පූ 950 දී පමණ යකඩ යුගයේ සංස්කෘතිය අර්ධ මහද්වීපික ඉන්දීයාවේ දකුණු දිගින් ශ්‍රී ලංකාවට කඩා වැදුණු බව දැරණියගල හා සෙනෙවිරත්න පෙන්නා දෙයි. ( සෙනෙවිරත්න 1996; 12 ). ශ්‍රී ලංකාවට සිදුවුණු ජන සංක්‍රමණ අතර වඩා ප්‍රබල වූ ජන සංක්‍රමණයක් ලෙස මේ ප්‍රාථමික යකඩ යුගය සංස්කෘතියේ කඩා වැදීම පෙන්වා දිය හැකි ය.යකඩ තාක්ෂණය, සත්ත්ව ගෘහාශ්‍රයකරණය, මැටි බඳුන් හා පබළු නිෂ්පාදන තාක්ෂණය, සරල කෘෂි කර්මාන්තය, ගැමි ජන පද පිහිටුවීම හා මූලක ජල කළමණාකරණ කටයුතු මේ සංස්කෘතියේ සුවිශේෂ ලක්ෂණ වන බව සෙනවිරත්න පෙන්වා දෙයි ඃසෙනවිරත්න 1996:12). දැරණියගල විසින් අනුරාධපුර ඇළුපුර ජනාවාසය අළලා සිදු කොට ඇති කැනීම් මගින් ඔප්පු කොට ඇත්තේ එවකට එහි පැවති මධ්‍යශිලා ජනාවාසය මතට බවයි ( Deraniyagala 1992:709). පසෙල් රාජන් ආදි විද්වතුන් පෙන්වා දෙන ආකාරයට මුල් ඓතිහාසික යකඩ යුගයේ සංස්කෘතිය දකුණු ඉන්දියාව තුළ හැඩ ගැසී ඇත්තේ ක්‍රි.පූ. 1250 තරම් ඈත වකවානුවේ දී වේ (Poseehi:1990;Ranjan:1990). මහා සංස්කෘතියක් ලෙස ඉන්දියාවේ

හැඩ ගැසී වර්ධනය වීමෙන් අනතුරු ක්‍රි.පූ. 1000 දී පමණ මෙය ශ්‍රී ලංකාවට කඩා වැදී තිබේ

:(Deranayagala :1992;Senavirathna:1984) මේ සංස්කෘතියට අදාළ භූමදාන සංකීර්ණ සහ ජනාවාස ගොඩ නැගූ ස්ථාන ශ්‍රී ලංකාව පුරාම ව්‍යාප්ත වන්නට විය. ශ්‍රී ලංකා සමාජය තුළ හටගත් නව සංස්කෘතියක් වශයෙන් එය හැඳින්වීමට හැකි ය. (Senavirathna: 1984:237-307)

මේ යුගයෙහි ජීවත් වූ මානවයා පිළිබඳ ව මෙතෙක් ජෛව විද්‍යාත්මක පර්යේෂණවලට භාජනය කොට ඇත්තේ පොම්පරිප්පුව මෙගතිලික සුසාන භූමියෙන් ලැබුණ ඇට සැකිල්ලක් පමණි. ඒ අනුව මුල් යකඩ යුගයේ ජීවත් වූ මේ මිනිසාගේ ජෛව විද්‍යාත්මක ලක්ෂණ බලංගොඩ මිනිසාගෙන් වෙනස් ය. (දැරණියගල 2000:89). පොම්පරිප්පුවෙන් ලැබූ කාල නිර්ණය නොකළ මානවශේෂවලින් විද්‍යමාන වන පරිදි මේ යුගයේ මානවයා සැළකිය යුතු සම්මිශ්‍රණයක් පිළිඹිබු කරයි. මෙය සිදුවන්නට ඇත්තේ ක්‍රි.පූ. 500 ට පෙර දෙවැනි සහශ්‍රයේ සහ බෙල්ලන්බැඳිපැලැස්ස අවදියේ එනම් ක්‍රි. පූ 4500 ට පසු කාල පරිච්ඡේදය තුළ දී විය හැකි ය. (එම). කාබන් 14 කාල නිර්ණයට අනුව ක්‍රි.පූ. 750-400 අයත් ඉබ්බන්කට්ටුව සුසාන භූමියත් ඊට සමීප ප්‍රදේශ වන ආනේකටාව, කන්දලම, රොටවැව, සීගිරිය ඇදී ප්‍රදේශවලත් වාස භූමි පිහිටුවා ගැනීමෙන් ඒ තත්ත්වය පැහැදිලි වේ. (සෙනවිරත්න 1996:15) සෙනවිරත්නගේ පරිසර පුරා විද්‍යා අධ්‍යන හා මානව වංශ පුරා විද්‍යා අධ්‍යන මගින් පෙන්වා දෙන වැදගත් කරුණ වන්නේ උත්තර මලය රට්යයේ නිවැසි ප්‍රාථමික යකඩ යුගයේ ජනතාව අනිවාර්යයෙන් ම මධ්‍ය කඳුකරයේ නිවැසි ප්‍රාග් ඓතිහාසික මිනිසුන් සමග මූලික සමාජ සම්බන්ධතා ආරම්භ කළ බවයි. (සෙනවිරත්න 1996:189). මේ සමාජ සම්බන්ධතා භාණ්ඩ හුවමාරුව සමග ඇති වන්නක් වන අතර මේ සමඟ ම අප තේරුම් ගත යුත්තේ මේ ජන සංස්කෘති අතර ජානමය සබඳතා ඇති වීමට ප්‍රබල ඉඩක් මේ ක්‍රියාවලිය සමග පවතින්නට ඇති බව යි.

අප ඉහතින් විස්තර කළ ප්‍රාග් ඓතිහාසික හා මූල ඓතිහාසික ජන කණ්ඩායම් පිළිබඳ කිසිදු විස්තර සහිත සටහනක් අපේ ලේඛනගත

ඉතිහාස තුළ අන්තර්ගත නොවේ. ශ්‍රී ලංකාවේ ඉතිහාසය ලේඛනගත කළ ගිහි පැවිදි විද්වත්හු අප රටේ ජනයා පදිංචි වීමේ මෝස්තරය පිළිබඳ ව කරුණු දක්වා ඇත්තේ ක්‍රි.පූ. සයවන සියවස උතුරු ඉන්දීය ආර්යය ජන කණ්ඩායමක් මූලික කර ගෙන ය. ඒ ජන කණ්ඩායම ඉස්මතු කිරීමෙහිලා එවකට දේශිය ව සිටි ජන පිරිස් යක්ෂ, නාග, පුලින්ද, ව්‍යාධ, මිලක්ඛ, මනුස්ස, වනචරක යනුවෙන් දක්වමින් ආන්තීකරණයකට ලක්කර තිබීම මහාවංසය හා චූලවංසය පරිශීලනය කිරීමෙන් දත හැකි වේ. මහාවංසයේ විජය කථා පුවත විමර්ශනාත්මක ව අධ්‍යනය කළ හොත් එයින් ද අපට පැහැදිලි වන්නේ ජන සංක්‍රමණයක් හා ජන සම්මිශ්‍රණයක් ක්‍රි.පූ. සයවන සියවස තුළ දී තිබෙන බව ය. විශේෂයෙන් විජයගේ පැමිණීමෙන් ජන සංක්‍රමණ සිදු වීමත්, විජය හා කුවේණිය ගේ විවාහය මගින් ජන සම්මිශ්‍රණයක් සිදු වූ බවත් වංසකථා පුවත් අනුව ද පැහැදිලි වේ.

මේ සිද්ධි හා දේශීය මුල් ඓතිහාසික යුගය (ක්‍රි.පූ. 300- ක්‍රි.ව. 100) ඉතා වැදගත් වේ. මේ කාල පරාසය පිළිබඳ ව අප රටේ විසූ විවිධ ජන කණ්ඩායම් ආශ්‍රිත ලිඛිත සාධක පැහැදිලි ව සටහන් වන අතර, මේ සඳහා ශ්‍රී ලංකාවේ ආදිතම බ්‍රාහ්මී අභිලේඛන හා වංශ කථා තොරතුරු සපයා දේ. මුල් ඓතිහාසික යුගයට අයත් ආදිතම බ්‍රාහ්මී අභිලේඛනවල විවිධ පදවිනාම සහිත පුද්ගල විස්තර අන්තර්ගත ය. ඔවුන් අතර පරුමක, ගහපති, ගාමික, බරත, බත යනාදී වංශාවලි සුවිශේෂි වේ. මේ ජන කණ්ඩායම් පිළිබඳ සටහන් ද මඳය. වංසකථාවල මොවුන් පිළිබඳ විස්තර අන්තර්ගත නොවන අතර, මොවුන්ගේ කාර්යාවලිය කෙබඳු පසු බිමක ඉටු විණි ද යන්න පිළිබඳ ව තොරතුරු දත හැකි වේ.

සුදර්ශන් සෙනවිරත්න විසින් සිදු කරන ලද සමාජ පුරාවිද්‍යා අධ්‍යයන (Social Archaology) මගින් මේ සඳහා යම් තොරතුරු ග්‍රහණය නර ගැනීමට හැකි වේ. ඔහු පෙන්නා දෙන ආකාරය ට පරුමකයින් මේ පදවි නාමය ලබන්නට ඇත්තේ පරම්පරානුකූල ව නොව, පදවිය හෙවත් නිල තත්ත්වය පෙන්නුම් කරන නාමයක් ලෙස වන්නට ඇතැයි සිතිය හැකි බවත්, එසේ ම මේ පරුමකයින් සමහර දෙනෙකුගේ මුතුන්මිත්තන්ගේ පරපුර මූල ඓතිහාසික යුගය

දක්වා අතීතය හා සම්බන්ධ බවත් ය (සෙනෙවිරත්න 1996: 25). කෙසේ වෙතත් අශ, ගහපති, ගමික යන ජන කණ්ඩායම් මුල් ඓතිහාසික යුගයේ සමාජය තුළ විසූ ධනවත් ජන කණ්ඩායම්වලින් සම්භවය ලද්දෝ වෙතැයි සෙනෙවිරත්න පෙන්වා දෙයි.

මුල් බ්‍රාහ්මී අභිලේඛනවල සඳහන් වංශාවලි අතර භරත යන ජන කණ්ඩායම ද ඉතා වැදගත් වේ. සෙනෙවිරත්න විග්‍රහ කරන ආකාරයට මේ පිරිස ලංකාව හා ඉන්දියාව අතර වෙළඳාම හා සම්බන්ධ ය. පාකර්ට අනුව කම්කරුවා වශයෙන් ද, වික්‍රමසිංහට අනුව ස්වාමියා, සහෝදරයා වශයෙන් ද බෙල්ට අනුව භාරත වශයෙන් ද පරණවිතානට අනුව ස්වාමියා වශයෙන් ද අර්ථ දැක්වී තිබේ (සෙනෙවිරත්න 1987.68). සෙනෙවිරත්න පෙන්නා දෙන ආකාරයට භරත යන පදයේ අර්ථය වෙනස් ව දක්වා ඇත්තේ මෙලෙෝන් ය. ඔහු පවසන ආකාරයට එය සංස්කෘතයේ භරත යන්නෙහිත් ප්‍රාකෘතයේ හෝ සිංහලයේ භරත යන්නෙහිත් ද්‍රවිඩ අනුවාදයයි (එම). ද්‍රවිඩ නිරුක්ති ශබ්ද කෝෂයට අනුව පරතර්, පරතවර්, පරවර් යන පද භරත යන්නට සමාන ය. එසේ ම සංගම් කාව්‍යවල පරතවර් ජන කොටස පිළිබඳව දැක්වෙන මානව වංශ සටහන් ද මගින් ඉතා පැහැදිලි ව මේ පිරිස දූරාතීත කාල පරිච්ඡේදයක සිට සමුද්‍රාශ්‍රිත පරිසරයක් තුළ වර්ධනය වූ අන්දම පෙනෙයි (එම 68-69). මූලාරම්භය අපැහැදිලි වුව ද ඔවුන්ගේ ප්‍රභවය ප්‍රාග් ඓතිහාසික මධ්‍ය ශිලා යුගය දිවයන බව අනුමාන කළ හැකි ය. කෙසේ වෙතත් භරත යන කණ්ඩායම ඉතා පැහැදිලි ලෙස දකුණු ඉන්දීය සම්භවයක් සහිත කණ්ඩායමක් ලෙස හඳුනා ගැනීම මේ කරුණු අනුව සාධාරණ වේ.

මුල් ඓතිහාසික සමය වන විට විසූ මේ ජන කණ්ඩායම් අතර ඥාතීත්ව සබඳතා ගොඩ නන්වා ගැනීම නිසා සම්මිශ්‍රතා සිදු වී තිබෙන බවට ද කරුණු තිබේ. මේ අතර පරුමකවරු හා ගමිකවරු අතර විවාහ සබඳතා සිදු වී තිබේ. දඹුල්ලේ සහ රනගිරමඩ අභිලේඛනවල ගමික වහබගේ දුව පරුමකයෙකු හා විවාහ වී ලෙන් පූජා කළ බවට සාක්ෂි ඇත (සෙනෙවිරත්න 1996: 26). මේ තත්ත්වයන් සමග පරුමක පදවි දරන්නන් සමහර දෙනෙකු විශේෂයෙන් ම ගහපති පවුල් වලින් ඉස්මතු වීමෙන් ගමික, වාතංභරත

හා අප කණ්ඩායම් සමග විවාහ හෝ වෙනත් සමාජ සම්බන්ධකම් ඔවුන්ට තිබීමත් වැදගත් කරුණකි (එම).

එසේ මුල් ඓතිහාසික සමයේ තවත් ජන කණ්ඩායමක් වූ බත පුද්ගලයෝ දකුණු ඉන්දියාවේ ධනවත් බරත කණ්ඩායම් සාමාජිකයෝ වූහ (එම.27). මේ ආකාරයට වූ විවිධ ජන සම්මිශ්‍රතා ඔස්සේ අප රටේ ආර්ථික ක්‍රියාවලිය පාලනය වීම සිදුවීම සුවිශේෂ කරුණක් වන අතර මුල් ඓතිහාසික සමය වන විට ජන සම්මිශ්‍රතා ආගමික ආයතන වෙතට ද යොමු වූ බවට ද කරුණු තිබේ. එයට කදිම නිදසුනක් වන්නේ අනුරාධපුර අභයගිරි විහාරයේ ඇති භරත ශිලා ලේඛනයක ද්‍රවිඩ ශ්‍රමනයෙකු හා ද්‍රවිඩ ගහපතියෙකු පිළබඳ සඳහන් වේ (Paranavithane 1940:54-56).

මුල් ඓතිහාසික යුගයට සම්බන්ධ ජන සංක්‍රමණ හා ජන සම්මිශ්‍රතා තොරතුරු අතර මහින්දාගමනයෙන් පසුව සිදු වන දහඅට ශ්‍රේණියක පිරිස් පැමිණීම ද නැවතත් මෙරට තුළ ජන සම්මිශ්‍රණයන්ට බලපාන අවස්ථාවක් ලෙසද පෙන්වා දිය හැකි ය (ම.ව.19 : 66). මේ ආකාරයට ප්‍රාග් ඓතිහාසික යුගයේ මුල සිට මුල් ඓතිහාසික යුගය දක්වා වූ කාල පරාසය තුළ ඉන්දියාව හා ශ්‍රී ලංකාව ඇතුළු භූමි කලාපය තුළ විවිධ ජන සංක්‍රමණ හා සම්මිශ්‍රතා සිදු වී ඇති බව පුරාවිද්‍යාත්මක කරුණු මගින් පැහැදිලි වී තිබේ. ඒ අනුව මෙරට ජීවත් වන ජනතාවට වඩා නිශ්චිත ව අප මේ ජන වර්ගයට අයිති සුජාත පිරිසක් ලෙස පැවසිය හැකි ද යන්න පිළිබඳ ව අවකාශයක් පැන නැගෙනු ඇත.

## ආශ්‍රිත ග්‍රන්ථ

01. Bossuyt F.M.- Meegaskumbura 2004 Local endemism within the western Ghats-Sri Lanka Biodiversity Hot Spot, *Science,* 306:479-481

02. Cooray P.G. 1984 An Introduction to *The Glory of Sri Lanka*

03. Deraniyagala P.E.P 1958 *Pleistocence of Ceylon-Ceylon National Museum ix 164*

04. Deraniyagala S.U.; K.A.R Kenedy 1989
Fossil remains of 28000 years old hominidis from Sri Lanka current
*Anthrpology 30(3) :394-399*

05. Deraniyagala S.U.2004 *The Pre History of Srilanka*

06. Deraniyagala S.U.2004
*Pre History basis for the rise of civilization in Sri Lank and South India*

07. Narasimhaiah B.;P.S Sriraman 2004
A Neolothic Culture in South Karnataka (kavery vallery
*Indian pre history and proto history 203-205*

08. Premathilaka T.R.2003
*Late Quaternary palaeoecological Stratigraphy in the horten plains, Central Sri Lanka.*
Stockholm University: Department Of physical Geogrop and Quaternary Geology
ph.D.thesis in Quaternary Geology

09. Kennedy K.A.R.; T .Disotell;W.J.Roertgen;J Chiment & J.Sherry1986 Biological Anthropology of upper pleistocense hominds from Sri Lanka Batadomba and Belilena caves *Ancient Ceylon* 06 165-265

10. Paranavithane S.1940 Tamil householders terrace Anuradhapura *journal of the Royal Asiatic Society* : Ceyl Branch vol xxv 54-56

11. Posshel G.1990 *Scientific datas for south Asian Archeo ogy* University pennsylvania:University Museum. Asian section ,1

12. RAnjan K.1990 New light on the Megulithic culture of t kongu region,Tamil nadu,Man and Environment
15 (1) : 93-102

13. Senevirathne S.1984 The Archology of the Megalitic Black and redware complex in srilanka *Ancient Ceylon* 05:237-307

14. අධිකාරි ගාමිණී 2005 ශ්‍රී ලංකාවේ ප්‍රාග් ඓතිහාසික උරුමය හා කළමණාකරණය
පුරාතනඃ 20-24

15. දැරණියගල සිරාන් 2000
ශ්‍රී ලංකාවේ ප්‍රාග් හා පූර්ව ඓතිහාසික ජනාවාස
පරිවර්තනයඃනිමල් පෙරේරා
චිරන්තන : 76-92

16. දැරණියගල සිරාන් 1990 පුරා විද්‍යා කැණීම් 1968-1990
පරිවර්තනය ඃකේ.බී.ඒ. එඩ්මන්ඩ්
පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවේ ඉතිහාසය 221-234

17. සෙනෙවිරත්න සුදර්ශන් 1996
උත්තර මලය රට්ඨයේ යකඩ යුගයේ ඛණිජ සම්පත් පරිහරණයේ ඓතිහාසික පුරාවිද්‍යාව ශ්‍රී සුමංගල විද්‍යාලයීය බෞද්ධ සංගමයේ ප්‍රකාශනය 184-19

18. සෙනෙවිරත්න සුදර්ශන් 1996
පර්යනිත ප්‍රදේශ හා අන්තික ප්‍රජාවෝ ශ්‍රී ලංකාවේ මුල් අයස් සමයේ ද්‍රව්‍ය හා සමාජ සැදුම
පිළිබඳ විකල්ප තේරුමක් කරා
ආචාර්ය උපාධි නිබන්ධනය 1-31

19. සෙනෙවිරත්න සුදර්ශන් 1987 ලංකාවේ මුල් ඓතිහාසික යුගයේ ජන සම්මිශ්‍රනය පිළිබඳ අධ්‍යනයක් යාත්‍රා කලාප 167-83

20. සුමංගලඃ බටුවන්තුඩාවේ 1996
මහාවංසය ද්වීතීය මුද්‍රණය